127

දුර්ලභ

# නූගත්කම, සංවර්ධනාත්මක සන්නිවේදනය සහ ජාතික සංවර්ධනය

(නූගත්කම, සංවර්ධනාත්මක සන්නිවේදනයේදී යෝජිත සංවර්ධන ක්ෂේත්‍ර කෙරෙහි බලපාන ආකාරය)

RECEIVED
1986 සැප් - 8
කැලණිය විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව
විභාග ශාඛාව

එච්. පී. නිහාල්සිරි ගුණවර්ධන
(බී. ඒ. ගෞරව)

පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව මැතිවරණ කොට්ඨාශයේ ටාරියාව ගම ඇසුරින් කරනු ලැබූ අධ්‍යයනයක්

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 127 |
| වර්ග අංකය | |

ජනසන්නිවේදනය ශාස්ත්‍රපති උපාධිය සඳහා
කැලණිය විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරන
පර්යේෂණාත්මක නිබන්ධය

1986

## පිවිසුම

"සන්නිවේදනය" යන්න මෑතකදී අපගේ විද්‍යානුල විෂය ක්ෂෙත්‍රයට ඇතුලත් වූ වචනයකි. නමුත් "සන්නිවේදනය" යන වචනයේ අරුත පැහැදිලි වන්නා වූ "සන් + නිවේදනය" යන්න, මිනිස් ඉතිහාසයේ ආදිම කාලයේ පටන් පැවත එන්නාවූ මිනිස් ක්‍රියාවලියේම කොටසකින් බව දැනට හඳුනාගෙන තිබෙන්නෙකි. එනම්, සංඥා හෙවත් පණිවිඩයන් නොහොත්, යම්කිසි නිවේදනයක්, නිකුත්කිරීම යන අරුත මින් පැහැදිලි ව, උඩු අර්ථයෙන් දැක්විය හැක්කකි. මෙහිදී දැක්විය යුතු මිනිස් සංඥාවන් හඳුනාගෙන කටයුතු කිරීම අද විෂය ක්ෂෙත්‍රය තුල මුල්තව කෙරෙන්නක් හැටියට පෙන්වා දීමට පුළුවන. නමුත් මේ හඳුනාගැන්මට පෙර වුවද, මිනිසා විසින් තමන්ගේ භෞතික හා මානුෂික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සන්නිවේදනය නොහොත් පණිවිඩ හුවමාරුව භාවිතා කොට තිබේ. මෙහිදී පණිවිඩ හුවමාරුව යනු මිනිසාගේ අවශ්‍යතා ඉටුකර ගැන්මකි. මිනිස් අවශ්‍යතා යනු නොසන්සිඳෙන චෛතසික බලාපොරොත්තු සමූහයකි. අද එකක් බලාපොරොත්තු ඉටු වීමෙන්, තවත් එකක් හෝ, සමූහයක් ඒ තුලින් උපදී. විශේෂයෙන් බලාපොරොත්තු ඉටුවීම යනු, තවත් අයකුගේ ඉෂ්ට වූ හැඟීම් සමුදායක සාර්ථක ප්‍රතිඵලයකි. එහෙත්, සැමදාම ලොව පැවතීමට ඉවහල් වන්නා වූ මේ හැඟීම් සමුදාය තුලින් අපට දක්නට ලැබෙන්නේ ඉටු නොවුනා වූ හැඟීම් රාශියක් පමණි. එම නිසා, ඉටු නොවුනාවූ හැඟීම් තුලින් මිනිස් පැවැත්මේ ඉදිරි මාර්ගය සලකුණු කරන්නකි

නොහොත් ඉද්රි කටයුතු පිළිබඳ චෛතසිකයන් උපදවා ගැනීමක් පමණි. එහෙත් ඒ මිනිස් අවශ්‍යතා පිළිබඳ ආරම්මණය මේ දක්වා ලෝකය පැවැත්ම පිළිබඳ කටු සටහනක් ලෙස මෙහිදී මම දක්වමි. සන්නිවේදනය ද පලෙස යයි සඳහන් කරන්න පුළුවන. මිනිසකු විසින් තමන්ගේ මනස තුල උපදින්නා වූ හැඟීම් තවත් අයකුට පරිවර්තනය කොට දැක්වීම සන්නිවේදනය වුවද එයත් වඟී කොට දැක්වීමට පුළුවන. තමන්ගේ මනස තුල උපන් හැඟීම, තමන් විසින්ම ග්‍රහණය කොට විවරණය කරන්නේ නම්, එය අන්තර් වර්ති පුද්ගල සන්නිවේදනය (INTRA-PERSONAL COMMUNICATION ) ලෙසින් හඳුන්වා දේ. එලෙසම, තම සිත තුල උපන් හැඟීම් සමුදාය ඒ අයුරින් තවත් කෙනෙකුට ග්‍රහණය කර ගැනීමට හැකිවන පරිදි දක්වන්නේ නම් එය පුද්ගලාන්තර සන්නිවේදනය නමි. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය හා පුද්ගලාන්තර සන්නිවේදනය අතර ඇත්තාවූ, ප්‍රධාන වෙනස නම්, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේදී තමන්ගේ මනස තුලම සන්නිවේදනය ක්‍රියාත්මක වන අතර පුද්ගලාන්තර සන්නිවේදනයේදී යමෙකු විසින් එවනු ලබන සංදේශය පිළිබඳව අන් අයෙකුට සිතීමට මෙන්ම ඒ පිළිබඳ පෞද්ගලික තීරණයන් ගැනීමට හැකියාව ලැබීමයි. එහිදී සමහර විට සංදේශය එවනු ලැබූ පළමු පුද්ගලයාගේ අරමුණ දෙවන පුද්ගලයා නොහොත් ග්‍රහණය කරගනු

ලබන්නා තුලින් ඉටු නොවීමට පුළුවන.

නූතන කාර්මික ලෝකයේ සන්නිවේදනය වඩාත් පෞද්ගලව භාවිතාවන්නක් ලෙසින් හඳුන්වා දෙන්නට පුළුවන. ඒ මන්ද, සන්නිවේදනයේ පෞද්ගලිකත්වය සීමාසහිත කේන්ද්‍රය ඉක්මවා ගමන් කිරීමට සිදුවී තිබෙන්නේ, මිනිසාගේ ප්‍රබල පැතිරයාමත් සමඟ ඇති වූ අවශ්‍යතාවන්ගේ බහුලත්වයත් සමගයි. එහෙයින් නූතන්යේ සන්නිවේදනය යන්න භාවිතා වීමේදී, පෞද්ගලික අවශ්‍යතා තුලින් පොදු අවශ්‍යතා ඉටුකරන්නක් ලෙස හඳුන්වා දෙන්නට හැකිවී තිබේ. මින්සා තමන් මේ විශ්වය තුල උවමනාව හා අවශ්‍යතාවය මත පැතිරියාමත්, කාර්මික ලෝකය ඒ තුල අවතීර්ණ වී කමයුතු කිරීමත් සමඟ මාධ්‍ය භාජනයකට හුරු විය. අද ලෝකයේ කිසියම් ස්ථානයක සිදුවන මෙහෙයත්, ලෝකයේ තවත් ස්ථානයක සිදුවීමකට සමාන කිරීමට එසේත් නැතිනම්, දැන ගැන්මට ඇති උවමනාව තුලින් මාධ්‍ය භාවිතය හටගනු ලැබුයේ යයි සිතීමට පුළුවන. එම නිසා ලෝකයේ ජනමාධ්‍ය භාවිතය යනුවෙන් හඳුන්වන්නේ මහජන අවශ්‍යතා ඉටු කිරීමක් ලෙසින් දැක්වීම යෝග්‍ය වේ.

මහජන අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා භාවිතා කරනු ලැබූ ජනමාධ්‍ය, පුළුල් ලෙස පැතිරීමත් සමඟ එයින් ඉටුවන හා බලාපොරොත්තු වන්නා වූ සේවය, අංග කිහිපයකට බෙදා දැක්විය හැකියි. තොරතුරු සැපයීම, තොරතුරු

සැපයීම තුලින් ලබන්නා වූ ඉඳ්රිය පිලිබඳ අත්දැකීම, හා සමාජ හැඩ ගැස්වීමත් ජනතාවගේ ප්‍රාතෘතික අවශ්‍යතාවය වන විනෝදාස්වාදනය සැපයීම වැනි අංග රාශියක් බලාපොරොත්තු වන සේවය වශයෙන් සාරාංශ කොට දැක්වීමට හැකිවී තිබේ. එම නිසා වර්තමාන මිනිසාගේ මෙම පෞද්ගලිකවුත්, පොදුවුත්, යහපත වෙනුවෙන් වන්නා වූ සේවය සඳහා ජනමාධ්‍ය ක්‍රියාකිරීම අපට දක්නට තිබෙන්නේ. නමුත් වර්තමාන සන්නිවේදන විද්‍යාඥයින් හඳුන්වා දී ඇති පරිදි ජනමාධ්‍ය භාවිතය ඇසුරින් ඉහතින් දැක්වූ බලාපොරොත්තු වෙනුවට අයහපත් ප්‍රතිඵල ගෙන දෙනු ලබන්නා වූ, ඵලයන්ද ඒ තුලින්ම ලබන බව පෙනී යයි. නිදසුනක් වශයෙන් අද අපට මුණ ගැසෙන්නා වූ විවිධ වර්ගයේ දැනුවීම් අනුව එහි සන්නිවේදකයා බලාපොරොත්තු වන්නාවූ, අරමුණු මගහැර, එයින් පරිභාගිර වූ අහිතකර බලපෑම් එල්ල ව් ඇති බව සඳහන් කරන්න පුළුවන් වී තිබේ. නිදසුනක් වශයෙන්, වෙළඳ දැන්වීම් යනු යම්කිසි ව්‍යාපාරයක ප්‍රතිඵල සහිත වන්නා වූ ක්‍රියාවලියකි. නමුත් එම ප්‍රතිඵලය ඒ තුලින් බලාපොරොත්තු වුවද, එයට ගොදුරු වන්නා වූ ග්‍රහකයා එය ග්‍රහණය කර ගන්නාවූ ආකාරය අනුව, ප්‍රතිඵලය වර්ග කර පැතිර් යයි. නිදසුනක් වශයෙන් ආහාර රසවත් කරන්නා වූ ද්‍රව්‍යක අගය දැන්වීම් තුලින් ප්‍රකාශ කරන්නට පුළුවන. එහෙත්

ආහාර රසවත් කරන්නා වූ ඒ ද්‍රව්‍ය විශේෂය සහතික කරන්නේ ආහාර පාලක මණ්ඩලයක විශේෂඥ, මහජන ආරක්ෂක පරීක්ෂකයන් තුළිනි. එහෙත් එම ආරක්ෂක මණ්ඩලය තම වගකීම් පැහැර හැර, පෞද්ගලික වාසිය මුදුන් පත් කරවා ගැනීම සඳහා, පොදු ජනයාගේ අවශ්‍යතාවය හා ජීවිත අපේක්ෂාව හීන කරන්නට කටයුතු කරන්නට වර්තමාන ලෝකයේදී බොහෝ දුරට ඉඩ ලැබේ. එහිදී සිදුවන්නේ කුමක්ද? පොදු මිනිස් ධර්මතාවයන්ටත්, වානිජ ලෝකයේ අපේක්ෂාවන්ටත් අනුව, සන්නිවේදන මූලධර්මයන්ට පටහැනිව ක්‍රියාත්මක වැඩ ප් පිළිවෙලක් දියත් වීම පමණයි. එසේ සිදුවුවහොත්, අපට දැක්විය හැක්කේ වර්තමානයේ ජනමාධ්‍ය භාවිතය ප්‍රබල ලෙස භාවිතා වුවද, එයින් බලාපොරොත්තු වන්නා වූ අරමුණ ඉක්මවා ගොස් ජනතාවගේ බලාපොරොත්තු රහිත අරමුණු කරා මෙහෙය වීමත් ඉන් සිදුවන බවයි. එහෙයින් අපට දැක්විය යුතුව තිබෙන්නේ ජනමාධ්‍ය භාවිතය මිනිස් වර්ගයාගේ පැවැත්මේ සිට විවිධ ප්‍රමාණයෙන් නූතනය දක්වා ගමන්කර මින් පැවතියද, අරමුණු වශයෙන් එහි යථාර්ථය ඉටු නොකරන බවයි.

එසේ නම්, දියුණු හා නොදියුණු වශයෙන් ලෝකය බෙදී පවත්නා වර්තමාන යුගයේ, නොදියුණු දේශයන් දියුණු තත්වයට පත්කිරීම සඳහා ජනමාධ්‍ය ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද? යන්න පිළිබඳව කරුණු විමසා බැලීමයි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය,

ජනමාධ්‍ය යනු, යම් රටක ජනතාව සඳහා තැපවී කටයුතු කරන්නක් නම්, ඒ ජනතාවගේ යහපත, දියුණුව, සඳහා එය අනිවාර්යයෙන්ම තැප විය යුත්තකි. එහෙත් සිදුවිය යුතු දේ එලෙස තිබියදී නොදියුණු දේශයන්හි ජනමාධ්‍ය ක්‍රියාකල යුතු ආකාරයත්, දැනට ක්‍රියාත්මක වන්නා වූ ආකාරයත්, පිළිබඳ පූර්ණ අධ්‍යයනයක යෙදිය යුතුව තිබේ. විශේෂයෙන් දියුණු ලෝකයේ දැනට ජනමාධ්‍යයන්ගේ සේවය ලබා තිබියදී, නොදියුණු ලෝකය ඒ සඳහා ආදර්ශය ලබා ගත යුත්තේ කෙසේද? යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය. යම්කිසි දේශයක අවශ්‍යතා, එසේත් නැතිනම්, දියුණුවම ජනමාධ්‍ය හිතකරව ක්‍රියාත්මක නොවන්නේ නම්, එහි ද් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටක ජනමාධ්‍ය සතු වගකීම වටහා ගැනීම මෙහිදී වැදගත් වේ. මෙවැනි රාජ්‍යයන් වල, මේ දක්වා ජනමාධ්‍ය පාරම්පරිකව යම්කිසි පරිනාමයකින් යුතුව ගමන්කර තිබියදීත්, තවමත් එහි යථාර්තවාදී අරමුණු ඉටු නොවන්නේ නම්, අපි වටහා ගත යුත්තේ, ජනමාධ්‍ය ක්‍රියාත්මක වීම සාධාරණ නොවන බවයි. එහිදී ඒ අසාධාරණත්වයට හේතු අප විසින් සොයා බැලිය යුතුයි.

විශේෂයෙන් නොදියුණු රාජ්‍ය විසින් තමන්ගේ දියුණුවේ උපක්‍රම සඳහා ජනමාධ්‍ය භාවිතා කිරීමේදී, එම හැකිම් ඇති නොකර ගෙන තිබෙන නිසා මේ

දත්වා ජනමාධ්‍ය සේවය ඉටු වී නොතිබීමට බලපා ඇත. විශේෂයෙන් ජනමාධ්‍යයන්ගේ වගකීම හා බලය පිළිබඳ දැනුම මේ රාජ්‍යතුල පාලක පැලැන්තියට නොවැටහීම මෙහිදී බලපා තිබේ. එසේ නම්, වර්තමානයේ මෙහි යුතුකම වන්නේ ජනමාධ්‍ය ක්‍රියාකිරීමට විරුද්ධව කටයුතු කිරීම හෝ එහි වැරදි පක්ෂය පිළිබඳ අගය කිරීම නොව, යහපත් සේවයක් සඳහා ජනමාධ්‍ය ක්‍රියාත්මක වීමට සැලසුම් සම්පාදනය කිරීමයි.

මේ නව සැලසුම් සම්පාදනයේදී සිදුවිය යුත්තක් තිබේ. එනම් ජනමාධ්‍ය මෙතෙක් පවත්වා ගෙන ආ ක්‍රමයත්, එහි සේවය අගය කිරීමත්, අන් අංග අගය කිරීමට හැකියාව ඇත්තාවූ පුද්ගලයන් සම්පාදන ශිල්පීන් ලෙස යොදා ගත යුතුව තිබේ. විශේෂයෙන් මේ දත්වා බටහිර ලෝකයේ උසස් විද්‍යාල තුලින් අධ්‍යාපනය ලබා, ඒ රටවල පැවැත්ම හා හැදියාව අගය කළාවූ, ශිල්පීන් විසින් ශ්‍රී ලංකාව වැනි රටවල ජනමාධ්‍ය භාවිතය පිළිබඳ සැලසුම් සම්පාදනය කිරීමෙන් එහි යහපත් ප්‍රතිඵලයන් දැකිය නොහැකිවීම පිළිබඳ හේතු යථාවබෝධයෙන් වටහා ගෙන ක්‍රියා කළ යුතුව තිබේ. එසේ නොවුන හොත් නැවත, නැවත සකස් කිරීම් තුලින් සිදුවන්නේ කුමක්ද යන්න වර්තමානයේ පෙනෙන්නට ඇත්තාවූ, ප්‍රතිඵලයන්ගෙන් තීරණය කිරීමටහැකියාව ලැබේ. එසේ නම් සංවර්ධනය බලාපොරොත්තු වන්නා වූ රටක් හැටියට ශ්‍රී ලංකාවේ

ජනමාධ්‍යයන්ට එම වගකීම ඉතා පුළුල් ලෙස භාවිතා කල යුතුව තිබේ.

පළමු පරිච්ඡේදයෙන් දැක්වෙන්නේ "නූගත්කම" යන්න විමසා බැලීමයි. "නූගත්කම" නිර්වචනය කිරීමත්, නූගත්කම බිහිවීම සඳහා බලපාන භෞතික හා මානුෂික හේතූන් විමසා බැලීමක් මෙහිදී කෙරේ. "නූගත්කම" ඇතිවීම සඳහා, බලපා ඇති කරුණු ශ්‍රී ලංකාවට විශේෂිතව විග්‍රහ කරනු ලැබේ. එහිදී අධ්‍යාපනය, මන්දපෝෂණය, ආයතන හා පුද්ගල දුර්වලතා යන අනු අංශයන් යටතේ විමසා බැලීම කෙරෙන්නේ පුළුල් වූ මාතෘකාවක් පිළිබඳ හරියාකාර අවබෝධයක් ලබා ගැනීම සඳහාය.

දෙවැනි පරිච්ඡේදය යොමුවන්නේ "සංවර්ධනය" යන්න නිර්වචනය කිරීමත්, සංවර්ධනය හා ජාතික සංවර්ධනයේ වෙනස හඳුනා ගැනීම සඳහාන්ය. විශේෂයෙන් ශ්‍රී ලංකාවට විශේෂිත කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ලැබූ තිබුනාවූ බටහිර නිර්වචනයන් මඟින් කරුණු විශ්ලේෂනය කිරීම පහසු වුවා යයි දැක්විය හැක. එසේම "සංවර්ධනය" පිළිබඳ සංකල්ප විග්‍රහයේදී අප දේශයට උචිත වන්නා වූ සංවර්ධන සංකල්පයන් බිහිකර ගැනීම කෙරේ. තවද මේ "සංකල්පය" තුල පවතින්නා වු විෂයානුකූල න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු වෙන් වශයෙන් දැක්වේ. එසේම, මාතෘකාවට අදාලව යෝජිත සංවර්ධන සැලසුම් පිළිබඳ හඳුන්වා දී පුත්තලම් දිස්ත්‍රික්කයේ, පර්යේෂණය කල කාල

සීමාවට අදාලව "කච්චේරියේ" නියමිත නිලධාරි මහතුන්ගේ උපදෙස් මත සැලසුම් පිළිබඳ විග්‍රහයක් කෙරේ.

තුන්වන පරිච්ඡේදය වෙන් වන්නේ පර්යේෂණ ගැටළු හා ක්ෂේත්‍ර අධ්‍යයන කල පිලිවෙල දැක්වීම සඳහාය. විශේෂයෙන් ප්‍රායෝගිකව විෂයානුකූල අධ්‍යයන කල ආකාරය, පර්යේෂණ අරමුණු, පර්යේෂණ ගැටළුව, හා ක්‍රමවේදය දක්වා තිබේ. එයේම මෙහි සමීක්ෂණය පැවැත්වූ ආකාරය පිළිබඳව පුළුල් විස්තරයක් හතරවැනි පරිච්ඡේදයේ 1 මූ: අංකය යටතේ දක්වා තිබෙන නිසා කෙටි විස්තරයකින් නිම කෙරේ. නමුත් සමීක්ෂණය පැවැත්වීමේ ක්‍රම පිලිවෙල වෙන් වෙන් වශයෙන් හා සමීක්ෂණ පත්‍රිකාවක් නොමැති වුවත්, තොරතුරු රැස්කරගත සිත්හි තබා ගත් ප්‍රශ්න මාලාව දැක්වේ. එයේම ඒ ප්‍රශ්න මාලාව ඉදිරිපත් කිරීමේ "ඌරියාව" ගම්මානයේ ගම්වැසියන්ගේ සාමාජික තත්වයට අනුවත්, අනේකුත් නිලධාරීන් සමග කෙරුණු සාකච්ජාවලද් ඒ අයගේ සාමාජික තත්වයට අනුවත් වෙන් වෙන් වශයෙන් කල බව කිවයුතුය.

හතරවන පරිච්ඡේදයෙහිද් කෙරෙන්නේ පර්යේෂණයේ අත්දැක්මී, පර්යේෂණයට භාජනය කල අයගේ සම්මුඛ සාකච්ජා හා ලද අත්දැක්මී පිලිබඳව විග්‍රහ කෙරේ.

මෙහිදී මා විශේෂ අවධානය යොමු කර තිබෙන්නේ සම්මුඛ සාකච්ඡා වලටයි. ඒ මන්ද, සම්මුඛ සාකච්ඡා ගම් වැසියන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගෙන්ද කෙරෙන නිසා සමහර ප්‍රශ්නකාරී තත්වයන්ද? උද්ගත වූ බව සඳහන් කල යුතුයි. විශේෂයෙන් රාජ්‍ය නිලධාරීන් හා සාකච්ඡා වලදීය. නමුත් සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට සත්‍ය තොරතුරු රාශියක් ලැබුණා යයි විශ්වාස කරමි. ඒ අනුව බොහෝ විට ගම් වැස්යන්ගේ සාකච්ඡා ඔවුන්ගේම ව්‍යවහාරික භාෂා වලින් දක්වන්නේ සමීක්ෂණය විශ්වාසවන්ත භාවය මෙන්ම එහි පර්යේෂණාත්මක ගුණය රැකීම සඳහාය.

පස්වන පරිච්ඡේදය මාතෘකාවට අදාලව පූර්ණයෙන්ම සමාලෝචනයක යෙදේ. මේ සමාලෝචනය කිරීමේදී නූගත්කම, සන්නිවේදනය, සංවර්ධනාත්මක සන්නිවේදනය, සංවර්ධනය, ජාතික සංවර්ධනය, යෝජිත සංවර්ධන සැලසුම් පිළිබඳ ඇති මතවාදයන් විග්‍රහ කරමින් නිගමනයන්ට එළඹීමට උත්සාහ ගතිමි. තවද මේ නිගමනයන්ට එළඹීම සඳහා සමීක්ෂණයේදී ලැබූ අත්දැකීම් ප්‍රධාන වශයෙන්ම මූලික වූවා යයි සඳහන් කල හැකියි. එයට අමතරව න්‍යායාත්මක තිබූ දැනුම තවදුරටත් වර්ධනය වී විෂය ක්ෂේත්‍රය පිළිබඳව සියුම්ව හැදෑරීමට හැකි විය.